# ශ්‍රී ලංකාවේ භාවිත වූ යටත්විජිත කාසිවලින් පිළිබිඹුවන දේශීය ලක්ෂණ


**බී. කේ. පී. දනුශිකා තරංගනි සෙනවිරත්න[1],**

**නිලන්ති බණ්ඩාර[1]**

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka



## සංක්ෂේපය

අනාදිමත් කාලයක සිට ස්වාධීන ජාතියක් වශයෙන් ප්‍රකටව පැවති ශ්‍රී ලාංකිකයන්ට ඇති වූ ප්‍රබලතම බලපෑම ලෙස යටත්විජිත පාලනයට නතුවීම හඳුන්වාදිය හැකිය. එනයින් පිළිවෙළින් පෘතුගීසි (ක්‍රි.ව. 1505-1638), ලන්දේසි (ක්‍රි.ව. 1638- 1796) හා ඉංග්‍රීසි (ක්‍රි.ව. 1796-1948) ජාතිකයෝ මෙරට පාලන බලය ලබාගත්හ. මෙම අවධීන් තුළදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය වැදගත්ම සාධකය බවට පත් වූ අතර එහිදී මුල්‍ය ක්‍රමය අනිවාර්යාංගයක් විය. ඒ තුළද කාසි හඳුන්වාදීම යටත්විජිත පාලකයින්ගේ ප්‍රධානාංශයක් වූ බැවින් ඒ ඒ අවධින්හිදී ශ්‍රී ලංකාවේ භාවිතය සඳහා කාසි නිකුත්කිරීමට ඔවුහු කටයුතු කළහ. ශ්‍රී ලංකාවේ යටත්විජිත පාලනයේ මූලාරම්භක අවස්ථාව වශයෙන් පෘතුගීසි පාලනය ආරම්භ විය. ඔවුන් විසින් මෙරට මුල්කාලීනව සමකාලීන පෘතුගාලය, ඉන්දියාව හා එම වකවානුව වන විට ශ්‍රී ලංකාව තුළ භාවිත කළ කාසි සංසරණයෙහි යෙදවූ අතර ශ්‍රී ලංකාවේ භාවිතය වෙනුවෙන්ම රන් හා රිදී වශයෙන් කාසි වර්ග ද්විත්වයක් නිකුත් කරන ලදී. S THOME රන් කාසිය වශයෙන්ද, ගිනිමඝස, මලක්කා හා ශාන්තුවර කාසි රිදී කාසි වශයෙන්ද හඳුන්වාදුණි. අනතුරුව මෙරට පාලන බලය ඕලන්ද ජාතිකයින් විසින් ලබාගත් අතර ඔවුන් මුල්කාලීනව ප්‍රතිකාල් කාසිම සංසරණයේ යෙදවූ නමුදු ඇති වූ අපහසුතා පදනම්කරගනිමින් මෙරට භාවිතයට කාසි නිකුත්කිරීම අරඹන ලදී. එහිදී ඕලන්දය, ගැඩර්ලන්තය, ෆ්‍රිස්ලන්තය, යුට්රැචය හා සීලන්තය ආදී ඕලන්ද ප්‍රාන්ත පහ තුළද, කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය හා යාපනය යන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක තුළද නිකුත්කරන ලද කාසි හඳුන්වාදුණි. එමෙන්ම අවසාන වශයෙන් බ්‍රිතාන්‍ය පාලනයට ශ්‍රී ලංකාව යටත්වූ අතර එම වකවානුවේදීද මුල් කාලීනව ලන්දේසි හා ඉන්දියාවේ භාවිතය සඳහා නිකුත් කරන ලද කාසිද, අනතුරුව පතාග, පනම් හා තුට්ටු භාවිත කළ අවධිය, පවුම්, සිලිම්, පැන්ස භාවිතය හා රුපියල්, සත භාවිත කිරීම වලංගු වූ අවධින් තුළදීද විවිධ ලක්ෂණ අන්තර්ගත කාසි සංසරණයෙහි යොදවන ලදී. එනයින් මෙම යටත්විජිත කාසි තුළ අන්තර්ගත වටපාඨ හා සංකේත පිළිබඳව අවධානය යොමු කරමින් ඒ තුළ විදේශීය ලක්ෂණයන්ට සාපේක්ෂව දේශීය ලක්ෂණ කෙතරම්දුරට අන්තර්ගතවේද යන්න සාකච්ඡා කිරීම වැදගත්ය. මෙහිදී කොළඹ ජාතික කෞතුකාගාරයේ යටත්විජිත කාසි එකතුන් තුළ අන්තර්ගත තොරතුරු, යටත්විජිත කාසි පිළිබඳ වාර්තාගත හා ග්‍රන්ථානුගත තොරතුරු අධ්‍යයනය කිරීම යනාදී ක්‍රමවේද භාවිතයට ගනිමින් මෙම අධ්‍යයනය සිදුකළ හැකිය. ඒ අනුව යටත්විජිත පාලකයින් විසින් ශ්‍රී ලංකාව වෙනුවෙන් හඳුන්වාදෙන ලද කාසි තුළ දේශීය ලක්ෂණ නියෝජනය කරන සංකේත හා වටපාඨ අල්ප වන අතර විදේශීය ලක්ෂණ බහුල බැව් ගම්‍ය වේ. මෙනයින් යටත්විජිත පාලන අවධිය තුළ ශ්‍රී ලංකාවට හඳුන්වාදෙන ලද කාසි මගින් දේශීයත්වය යටපත්කොට යටත්විජිතවාදය ඉස්මතු කිරීමට උත්සහගෙන ඇති බවක් ප්‍රකට වේ.



**ප්‍රමුඛ පද** - යටත්විජිත කාසි, දේශීය ලක්ෂණ, සංකේත, වටපාඨ, විදේශීය ලක්ෂණ



*1. පුරාවිද්‍යාව, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*